(49)

දෙපාර්තමේන්තු චක්‍රලේඛ 2006/5

මගේ අංකය : ප/5/දෙපා.ව/2006

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

2006.02. 27

සියළුම අධ්‍යක්ෂවරුන් /මාණ්ඩලික නිලධාරීන්,

නිලධාරීන්ගේ කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීම පිටිමත් කිරීම.

ලේකම්,වතු යටිතල පහසුකම් හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක ඊඅයිවල්/ඒ/එස්ටීඒඑෆ්එෆ්/01 හා 2006.02.03 දිනැති ලිපියෙන් මාණ්ඩලික නිලධාරීන්ගේ කාර්ය සාධන වාර්තා පිටිමත්ව ඉදිරිපත් කිරීම ගැන අවධාරණය කර ඇත.

02. ඒ අනුව රාජ්‍ය සේවයේ සෑම මාණ්ඩලික නිලධාරියකු විසින්ම සෑම වර්ෂයකම ආරම්භයේදී තම විෂයට අයත් කාර්යයන් ඉටු කිරීම සඳහා ඉලක්ක සකස් කොට කාර්ය සාධන වාර්තාව සමඟ ජනවාරි මස 31 දිනට පෙර අදාළ ඇගයුම්කරු හා ප්‍රමාණකරු වශයෙන් සිටින නිලධාරීන් ලවා අත්සන් කරවා ආයතන අංශය වෙත භාරදිය යුතුය. ඉන්පසු ජුනි මස අවසානයේදී ඒ දක්වා තමා විසින් මුලින් ඉදිරිපත් කරන ලද ඉලක්කයන් පදනම් කොට ජුනි මස 30 දින වනවිට ඉටුකර ඇති කාර්යයන් පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් සමඟ අර්ධ වාර්ෂික කාර්ය සාධන ඇගයුම් වාර්තාවක් සකස් කොට අදාළ ප්‍රමාණකරු හා ඇගයුම්කරුගේ නිර්දේශ සහිතව ආයතන අංශය වෙත ජූලි මස 15 දිනට පෙර භාරදිය යුතුය.

03. වර්ෂය අවසන් වූ පසු ඉහත පරිදිම වර්ෂය තුළ තම ඉලක්කයන් සපුරාගත් ප්‍රමාණයන් දැක්වෙන ප්‍රගති වාර්තාවක් සමඟ කාර්ය සාධන ඇගයුම් වාර්තාව ඇගයුම්කරුගේ නිර්දේශය හා ප්‍රමාණකරුගේ අනුමැතිය සහිතව ආයතන අංශයේ අතිරේක ලේකම් වෙත ඊළඟ වසරේ ජනවාරි 31 දිනට පෙර භාරදිය යුතුය.

04. වාර්ෂික වැටුප් වර්ධක ලබාදීමේදී මාණ්ඩලික නිලධාරීන් විසින් මෙම වාර්තා පදනම් කරගෙන නිර්දේශය හා අනුමැතිය දිය යුතු අතර, කිසිවිටෙකත් මෙම වාර්තා නොමැතිව වැටුප් වර්ධක දීම නොකළ යුතුය.

05. උසස්වීම් ලබාදීමේදී මෙම වාර්තා ගැන විශේෂයෙන් සලකා බලන බැවින්, ඇගයුම්කරුවන් හා ප්‍රමාණකරුවන් විසින් මෙම කාර්ය සාධන වාර්තා ලබා ගැනීමට කටයුතු කළයුතු වේ.

06. නිලධාරියා විසින් කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා උපයෝගි කරගත යුතු "අ" සහ "ආ" ඇමුණුම මේ සමඟ අමුණා ඇත.

07. මෙම ආකෘතිය සමඟ තමා විසින් වර්ෂය තුළ කිරීමට අපේක්ෂිත වැඩ පිළිබඳව ඉලක්ක පහත ආකෘතිය පරිදි සකස් කරගත යුතුය.

1. නිලධාරියාගේ නම :
2. නිලධාරියාගේ තනතුර :

උදා :- 2006 වසරේ ඉලක්කගත වැඩ.

කාර්යයන්	ඉලක්ක	ප්‍රගතිය
1. ගවයින් කෘත්‍රිම සිංචනය කිරීම. 2. දියර කිරි අලෙවි මධ්‍යස්ථාන ඇති කිරීම. 3. නිලධාරීන්ගේ වැටුප් වර්ධක ගෙවීම. 4. කාර්යක්ෂමතා විභාග පැවැත්වීම.	ගවයින් 3000 මධ්‍යස්ථාන 25 නිලධාරීන් 348 02	

02/.....

08. අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමේදී මෙයේ සකස් කරගත් ආකෘතියේ ජුනි මස 30 දක්වා ලබාගත් ප්‍රගතිය සටහන් කළ යුතුය. ප්‍රගතියක් නොමැති නම් හෝ අඩු නම් ඊට හේතුද සටහන් කළ යුතුය.වර්ෂ අවසානයේදීද මේ ආකාරයටම කටයුතු කළ යුතුය.

09. එක් එක් නිලධාරියාගේ ප්‍රමාණකරු හා අගැයුම්කරු වශයෙන් කටයුතු කළයුත්තේ පහත පරිදිය.

තනතුර	ඇගයුම්කරු	ප්‍රමාණකරු
1. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්		ලේකම්
2. අධ්‍යක්ෂවරු	ස.නි.හා සෞ.අ.ජ.	ලේකම්
3. නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ ජනරාල්
4. පශු වෛද්‍ය නිලධාරි	අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ ජනරාල්

10. මේ අනුව සැම නිලධාරියකුම 2005 වර්ෂය සඳහා වෙනත් අර්ධ වාර්ෂික කාර්ය සාධන වාර්තා දී නොමැති නම් ඒවාත්, වර්ෂ අවසන කාර්ය සාධන වාර්තා එකී අදාළ නිලධාරීන් 2006 ජනවාරි 31 දිනට පෙර තම ප්‍රමාණකරු වෙත භාර දියයුතුය. ප්‍රමාණකරු එම වාර්තා අධ්‍යයන කොට තමාගේ නිර්දේශ සහිතව ඇගයීම්කරු වෙත භාර දියයුතුය. ඇගයුම්කරු විසින් මෙම වාර්තාව තමන්ගේ ඇගයීම් සහිතව ආයතන අංශයේ අතිරේක ලේකම් වෙත 2006 පෙබරවාරි 10 දිනට පෙර යැවිය යුතුවේ.

එස්.කේ.ආර්.අමරසේකර,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

වම/-21